**ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**--------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**----------------------------**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-----------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශවාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම
**--------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.
වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග සැසඳීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.

(ආ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ මෙම වාර්තාව මගින් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ජෛව වත්කම් රු.මිලියන 4.69 ක්, පරිගණක මෘදුකාංග රු.මිලියන 16.09 ක් සහ නොනිමි ගොඩනැගිලි රු.මිලියන 530.53 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සියලුම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කල යුතුවේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ලබා ගෙන ගිණුම් ගත කිරීමේ කටයුතු කරනු ලැබේ. |

## 1.6.2 පොදු තැන්පතු ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තැන්පතු ගිණුම් 04 ක පැවති රු.මිලියන 66.95 ක් වර්ෂ 02 ක් තිස්සේ නිරවුල් නොකර පැවතුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව තැන්පතු මුදල් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. | නිරවුල් කිරීමට පියවර ගනිමින් පවතී. |

## 1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව රු. මිලියන 68.90 ක්වූ හිඟහිටි ණය ශේෂ වර්ෂ 01ක සිට වර්ෂ 05 කට වැඩි කාලයක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟහිටි ණය ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. | හිඟහිටි ණය ශේෂ අයකර ගනිමින් පවතී. |

### 1.6.4 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නොපිය වු අග්‍රිම ගිණුමේ රු.මිලියන 85.25 ක ශේෂයක් පැවතුණි. | මුදල් රෙගුලාසි 373(I) ප්‍රකාරව කටයුතු කල යුතුය. | නිරවුල් කිරීමට පියවර ගනිමින් පවති. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කාර්ය මණ්ඩල පුහුණු වැය විෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මගින් රු.මිලියන 300 මුදලක් වෙන් කරවා ගෙන තිබුණද, ඉන් රු.මිලියන 233.92 මුදලක් ඉතිරිවී තිබුණි. | අවශ්‍යතාවය මත වෙන් කර ගැනීම සිදුකල යුතුය. | අදාල සැපයුම් ආයතනය සමග ගිවිසුම් අත්සන් නොකිරීම හේතුවෙන් වියදම් දරා නොතිබුණි. |

### 2.2 බැරකම් හා බැදීම් වලට එළඹීම

| විගණන නිරීක්ෂය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැය විෂයන් 04 කට අදාළව ප්‍රතිපාදනයන්ගේ ඉතිරිවීම් ඉක්මවා රු.මිලියන 15.63 ක් බැරකම්වලට එළඹ තිබුණි. | ප්‍රතිපාදන සීමාව තුල වියදම් කිරීමට කටයුතු කල යුතුය. | ඉකුත් වර්ෂයේ බැරකම් නිරවුල් කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් 2018 වර්ෂයේ ප්‍රතිපාදන මගින් බිල්පත් නිරවුල් කිරීමට සිදු වී තිබුණු බව දක්වා ඇත. |

## 2.3 වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වෙනත් අමාත්‍යංශ 04 ක් සහ කාර්යාල 02 ක් විසින් විවිධ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා එකතුව රු. මිලියන 1,016.66 ක් ප්‍රතිපාදන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත මාරු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු. මිලියන 939.96 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | අරමුදල් වෙන්කල කාර්යය නිශ්චිත වශයෙන්ම ඉටුකර, වර්ෂය තුළදී උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. | කටයුතු නිම කිරීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලී මුදල් නොමැති වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2016 වර්ෂයේ වාර්ෂික අවශ්‍යතාවයක් සඳහා (කළු පාට හයිලෙග් බූට්ස් යුගල) 75,000 ක් මිලදී ගැනීමට ලංසු කැඳවා තිබුණු නමුත් විවිධ හේතූන් මත තෝරා ගන්නා ලද සැපයුම්කරු සමග ගිවිසුම්වලට එළඹීමේ කටයුතු 2018 ජූලි 02 දින සිදුකර තිබුණි. ගිවිසුම ප්‍රකාරව 2019 පෙබරවාරි 16 දිනට ප්‍රථම අදාල සැපයුම සම්පූර්ණ කළ යුතු වූ අතර 2019 ජූනි 15 දින දක්වා සැපයුම්කාලය දීර්ඝ කරවාගෙන තිබුණි. කෙසේ වෙතත් අදාල තොග 2019 මැයි 13 වන තුරුත් සම්පූර්ණ කර නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීමේ අවශ්‍යතාවය සහ වාර්ෂික අවශ්‍යතාවයන්ට අනුව අදාල මිලදී ගැනීම සිදු කිරීමට කටයුතු කල යුතුය. | 2017 වර්ෂයේ වාර්ෂික අවශ්‍යතාවය 75,000 ක ප්‍රමාණයක් වූ බැවින් ආරක්ෂක අමාත්‍යංශයේ උපදෙස් විමසීමෙන් පසුව මිලදී ගැනීම සිදුකල බව දක්වා තිබුණි. එමෙන්ම අදාල සැපයුම් ආයතනය සැපයුම් කාලය තුළ ඇණවුම සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි. |
| (ආ) | ආහාර බහාළුම් 399 ක් ප්‍රසම්පාදනය සඳහා 2017 මැයි 29 දින සිදුකල මිල කැඳවීමට අනුව ආයතන 06 කින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර, ඒ සඳහා තෝරා ගෙන තිබුණේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණු ආයතනයකි. තෝරාගත් ආයතනයේ මිල, අවම ලංසුව වූ | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයන් අනුව මිලදී ගැනීම් සිදු කිරීම උක්ත ප්‍රසම්පාදන ක්‍රමවේදයේ අඩුපාඩු නිවැරදි කිරීමටත් ඊට වගකිව යුතු පාර්ශ්ව හඳුනා ගැනීමටත් කටයුතු | ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට අනුව මිලදී ගැනීම සිදුකල බව දක්වා ඇත. |

| | |
|---|---|
| රු72,160 කට වඩා රු 9,540 කින් වැඩි මිලක් විය.ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් එම භාණ්ඩ නියමිත ප්‍රමිතියට නොමැති බව දක්වා තිබුණු අතර, එම හේතුව නිසා බහාලුම් භාරගැනීම සිදුකර නොතිබුණි. එසේ වුවද පසුව රු. 2,000 වට්ටමකට යටත්ව රු. 79,700 කට මිලදී ගෙන තිබුණි. ඒ අනුව අවම ලංසුවට මිලදී නොගැනීම හේතුවෙන් රු මිලියන 30.28 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිවයිනේ උතුරු ප්‍රදේශයේ මුර සංචාරක කටයුතු සඳහා යොදා ගෙන තිබුණු ස්ටැන්ඩඩ් වර්ගයේ පාපැදි 379 ක් කන්කසන්තුරේ 5 වන යුද්ධෝපකරණ රෙජිමේන්තුවේ ගබඩාව පිහිටි භූමිය තුළ එළිමහනේ ගාල්කර තිබුණි. එමෙන්ම විසුරුවා හැර තිබුණු ඒකකයන් විසින් භාවිත කල ද්විත්ව යකඩ ඇඳන් 355 ක් ගබඩා භූමිය තුළ අනාරක්ෂිතව තිබුණි. | වත්කම් සුරක්ෂිතව ගබඩා කළ යුතුය. | අදාල ඒකකයන් විසුරුවා හැරීමෙන් පසු පාපැදි මගින් ප්‍රදේශයේ මුර සංචාරක කටයුතු සිදු කිරීම නතර වී තිබීම හේතුවෙන් එම පාපැදි ගාල් කර තිබුණි. ගබඩා පහසුකම් නොමැතිවීම හේතුවෙන් යකඩ ඇඳන් එළිමහනේ ගබඩා කර තිබුණි. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සිද්ධීන් 169 කට අදාල එකතු වටිනාකම රු.මිලියන 13,600.30 ක් වූ හානි හා පාඩු හඳුනා ගෙන තිබුණි. සිද්ධීන් 37 කට අදාල වර්ෂ 05 ඉක්මවූ රු.මිලියන 88.29 ක්ද, සිද්ධීන් 63 කට අදාල වර්ෂ 10 ඉක්ම වූ රු.මිලියන 637.41 ක්ද විය. තවද 2016 දී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සාලාව කඳවුර තුල සිදුවූ ගිනි හානියේ තක්සේරු අගය වූ රු.මිලියන 12,829.22 ක්ද මීට ඇතුලත් විය. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම සිද්ධීන් නිරවුල් කර | පොත්වලින් කපා හැරීමට හෝ අත්හැරීමට හෝ වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් හානිය අයකර ගැනීමට කටයුතු කල යුතුය. | කඩිනමින් අදාල නිරවුල් කිරීමේ කටයුතු සමථයකට පත් කිරීමට ක්‍රියා කරනු ලැබේ. |

නොතිබුණි.

**3.4** **කාර්ය සාධනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොළඹ නගර සංවර්ධන කටයුතු සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි ඉඩම් හා ගොඩනැගිලි නිදහස් කිරීමට සිදුවීම හේතුවෙන් යුද්ධ හමුදා මූලස්ථානයේ ශාඛා හා අධ්‍යක්ෂ මණ්ඩල කාර්යාල පවත්වා ගෙන යාම සඳහා 2011 වර්ෂයේ සිට කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීමට රු.මිලියන 1,566.45 ක් වැය කර තිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිමකල යුතුය. | කොළඹ නගර සංවර්ධන කටයුතු සඳහා ගොඩනැගිලි ලබාදීම හේතුවෙන්, ගොඩනැලගිලි කුලී පදනම මත ලබා ගැනීමට සිදු විය |
| (ආ) | 2018 දෙසැම්බර් මාසයේ අඹේපුස්ස පිහිටි ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය වී තිබුණි. | | |
| i | සිමෙන්ති ගල් නිෂ්පාදන ව්‍යාපෘතියෙහි සමාලෝචිත වර්ෂය තුල නිෂ්පාදිත සිමෙන්ති ගල් 25779 ක් හමුදාවේ අභ්‍යන්තර ස්ථානවලටද,32,763 බාහිර පාර්ශවයන්ටද, එක් ගලක් රු. 34 බැගින් අළෙවි කර තිබුණි.එහෙත් කඳවුරේ අභ්‍යන්තර අවශ්‍යතාවයන් සඳහා බාහිර වෙළඳපොලෙන් පිළිවෙලින් බ්ලොග් ගලක් රු. 65 ක් සහ රු. 68 බැගින් ගල් 5,600 ක් සහ 3,600 ක් මිලදී ගැනීමට රු 608,800 ක් වැයකර තිබුණි.ගල් නිෂ්පාදනය කර ලබා ගත්තේ නම් රු මිලියන 0. 30 ඉතිරි කර ගත හැකිව තිබුණි. | රෙජිමේන්තුවේ සිමෙන්ති ගල් ව්‍යාපෘතියෙහි නිෂ්පාදනය කරනු ලබන සිමෙන්ති ගල් අභ්‍යන්තර කටයුතු වලට යොදා ගැනීමට ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය. | සිමෙන්ති ගල් ව්‍යාපතිය ආරක්ෂක අංශයේ ලියාපදිංචි ආයතනයක් නොවීම සහ ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල ලැයිස්තුගත ආයතනයක් නොවන බැවින් කඳවුරේ අවශ්‍යතා වෙනුවෙන් සිමෙන්ති ගල් මිලදී ගැනීම සිදු නොකරන ලදී. |

| | | | |
|---|---|---|---|
| ii | කඳවුරු භූමියේ වාර්ෂික පොල් නිෂ්පාදනය ගෙඩි 29,041 ක් වු අතර එම පොල් කඳවුරේ අවශ්‍යතා සඳහා භාවිතා නොකර එක් ගෙඩියක් රු 20-රු 25 අතර මිල ගණන් වලට සේවකයන්ට අලෙවි කර තිබුණි. කඳවුරේ වාර්ෂික ආහාර අවශ්‍යතාවයට කි. ග්‍රෑ 01 ක් රු 70 බැගින් පොල්කි:ග්‍රෑ 119,026 ක් බාහිර සැපයුම්කරුවන්ගෙන් ලබා ගැනීමට රු මිලියන 8.33ක් වැයකර තිබුණි. | පොල් අස්වැන්න කඳවුරේ අවශ්‍යතාවයන් වෙනුවෙන් යොදා ගැනීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. | යුද්ධ හමුදා කඳවුරුවල ආහාර අවශ්‍යතාවයන් සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත විවෘත ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කරමින් බාහිර සැපයුම්කරුවන් වෙතින් මිලදී ගැනීම සිදු කරනු ලැබේ. |
| iii | කඳවුරු භූමිය තුළ පිහිටි කළු ගලක් උපයෝගී කරගෙන 2014 වර්ෂයේ සිට 2018 මාර්තු දක්වා කළුගල් නිෂ්පාදන ව්‍යාපෘතියක්පවත්වා ගෙන ගොස් තිබුණු අතර එහි ආදායම රු මිලියන 7.14 ක් වු කළුගල් කියුබ් නිෂ්පාදන 2,213 ක් යුද්ධ හමුදාව වෙතටම අළෙවි කර තිබුණි. විකුණුම් ආදායම යුද්ධ හමුදා නිලධාරීන්ගේ සුභ සාධනය කටයුතු සඳහා රෙජිමේන්තු ආයතන සභාපතිගේ ගිණුමට පමණක් බැරකර කර තිබුණි. 2018 මාර්තු මස මෙම ව්‍යාපෘතිය නතර කර තිබුණු හෙයින් සභාපතිගේ ගිණුමෙන් රු. මිලියන 2.03 ක් වැය කර ලබා ගත් ගල් ඇඹරීමේ යන්ත්‍රය හා වැඩපල අත්හැර දමා තිබුණි. | ඉපයූ ආදායමෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුය. | රෙජිමේන්තුවේ සියලු නිලයින්ගේ සුභසාධනය සඳහා අවශ්‍ය ඉදි කිරීම් සහ සංවර්ධන කටයුතුවලට යොදා ගෙන තිබුණු බැවින් ඒකාබද්ධ අරමුදලට බැර නොකරන ලදී. |
| (ඇ) | මත්තේගොඩ පිහිටි 16 වැඩපල රෙජිමේන්තුවේ කාර්මික ගබඩාවේ පැවති භාණ්ඩ වර්ග 16 කට අදාල ඒකක 156 ක් වර්ෂ 08 කට වැඩි කාලයක්ද, අළුත් වැඩියා කිරීමේ කටයුතු සඳහා භාර දී තිබුණු වාහන 04 ක් වර්ෂ 02 සිට වර්ෂ 05 දක්වා කාල පරාසයක් තුළ අළුත්වැඩියා කටයුතු සිදු කර නොතිබුණි. | නිශ්කාරය තොග උපයෝජනය කිරීමේ කටයුතු හා අළුත්වැඩියා කිරීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | 2018 දෙසැම්බර් 11 දින 07 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ ඉන්ධන පිරවුම්හල පරීක්ෂාවේදී පොත් අනුව ඉන්ධන තොග ශේෂය හා භෞතික ශේෂය අතර සුපිරි ඩීසල් වර්ගයෙහි ලීටර් 1,199 ක අතිරික්තතාවයක් පැවති බව නිරීක්ෂණය විය. | ඉන්ධන තොග පොත් අනුව ශේෂය හා භෞතික ශේෂයන් අතර අතිරික්තතා සහ ඌණතා පැවතීමට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. | තොග පොත් අනුව ශේෂයන් සහ භෞතික ශේෂයන් අතර අසමානතාවය සාමාන්‍ය පරිචය අනුව ලීටර් 500 ක විචලනයක් පැවතිය හැකිය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනුමත සේවක සංඛ්‍යාව 200,242 ක්වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 167,234 ක් වුයෙන් පුරප්පාඩු 33,278 ක් විය. නිලධාරී මට්ටමින් තනතුරු 1,472 ක් හා සෙසු නිලධාරී 31,806 ක පුරප්පාඩු පැවතුණි. එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. සිවිල් කාර්යය මණ්ඩලයේ අනුමත තනතුරු සංඛ්‍යාව 11,146 වු ක් අතර තථ්‍ය සංඛ්‍යාව 10,306 වුයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 1,044 ක් හා අතිරික්ත කාර්යය මණ්ඩල 204 ක් විය. පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සහ අතිරික්තතා ඇති නොවන පරිදි කටයුතු කල යුතුය. | කාර්ය මණ්ඩලයේ අතිරික්තතා හා පුරප්පාඩු පවතින බව දක්වා ඇත. |